# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,421 - 2025 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2025.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 14 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

13 - B 082648 — 177 (2025/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**මහියංගණය දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

කොළඹ කොටුව, ලංකා බැංකු මාවතේ, අංක 01, ලංකා බැංකු චතුරශ්‍රයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ලංකා බැංකුව.

*...........පැමිණිලිකරු.*

නඩු අංකය : MB/02/13
ඇස්කිසි අංකය : 05/2024

*එදිරිව*

කටුගස්තොට, රණවන, අංක 141 ඒ හි පදිංචි,
විදානගමගේ වර්ණ තිලක් විදානගමගේ,

*.............විත්තිකරු.*

මහියංගණය දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ, තීන්දු ප්‍රකාශය ප්‍රකාර මා විසින් තහනමට ගන්නා ලද ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, බින්තැන්න කෝරළේ, සේරාණ ග්‍රාමයේ සේරාණ ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ පිහිටි "සේරාණ මූකලාන"" නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සගරන්දෙණිය මහතා විසින් 2005.07.07 වැනි දින මැන සකස් කරන ලද අංක 5009 දරන පිඹුරේ නිරූපිත අක්කර දෙකක් (අක්. 02) විශාල, පහත උපලේඛනගත දේපළ,

**2025 ක් වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ. ව. 11.00**ට, එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*දේපළට ළඟාවීම.-* මහියංගණය, පදියතලාව මාර්ගයේ කි. මී. 4.5ක් පමණ ගියවිට අරාවත්ත මංසන්ධිය දකුණුපසට වන්නට හමුවේ. එම මංසන්ධියේ සිට මී. 200 පමණ ඉදිරියට ගිය විට ප්‍රධාන මාර්ගයේ දකුණුපසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසියේ දී තීන්දු කළ විගස සම්පූර්ණ ගැණුම් මිලෙන් 25% මුදල (ඉතිරි 75% නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කිරීමට දින තිහක (30) කාලයක් දෙනු ලැබේ.)

පිස්කල් ගාස්තු (සම්පූර්ණ ගැණුම් මිලෙන් මුල් රු. 7,500/- ට රු. 150/- ක මුදලක් ද, ඉතිරි සෑම රු. 1,000/- කට රු. 5/- බැගින් සම්පූර්ණ මුදලම ගණනය කර ගෙවිය යුතුය.)

සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා බදුල්ල ලංකා බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් විමසන්න.

දුරකථන අංක : 055-2257280, 055-2258195,
ෆැක්ස් : 055-2258330

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, බින්තැන්න කෝරළේ, සේරාණ ග්‍රාමයේ, සේරාණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි "සේරාණ මූකලාන" නමැති ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සගරන්දෙණිය මහතා විසින් 2005/07/07 වැනි දින මැන සකස් කරන ලද අංක 5009 දරන පිඹුරේ නිරූපිත කැබැලි අංක 01 දරන කොටසට මායිම් : උතුරට : පදියතලාව මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට : ගල්පොත්තේ රක්ෂිතය ද, දකුණට : ජස්ටින් යන අය විසින් අනවසරයෙන් භුක්ති විඳින ඉඩම ද, බටහිරට : රජයේ ගොඩනැගිලි සඳහා වෙන් කර ඇති ඉඩම ද, යන මායිම් තුළ වූ අක්කර දෙකක (අක්. 02) ප්‍රමාණයකින් යුත් ඉඩම හා ඒ තුළ පිහිටි සියලු දේ ද වේ.

මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/RD 12/173 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම සිදු කරන ලද නැවත මැනීම අනුව පහත සඳහන් පරිදි වේ.

එනම්, බලයලත් මිනින්දෝරු එච්. එම්. චන්ද්‍රරත්න මහතා විසින් ඉහත කී "සේරාණ මූකලාන" නමැති ඉඩමට මැන සකස් කරන ලද අංක 1185 හා 2010/12/17 දරන පිඹුරේ කැබලි අංක 01 දරන කොටසට මායිම්, උතුරට : පදියතලාව මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට : ගල ද, දකුණට : ජස්ටින් යන අය විසින් වගා කරන ඉඩම ද, බටහිරට : මුඩු ඉඩම ද යන මායිම් තුළ වූ අක්කර දෙකක (අක්. 02) ප්‍රමාණයකින් යුත් ඉඩම හා ඒ තුළ පිහිටි සියලු දේ ද වේ.

බී. ඩබ්. දයාරත්න,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය, මහියංගණය.

01-721

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.